නිපුණතාව 7.0 - මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 7.2 - මුදලට ඉල්ලුමක් ඇති වීමට බලපාන හේතු සහ මුදල් ඉල්ලුම තීරණය කරනු ලබන සාධක විමසා බලයි.

<u>මුදල් ඉල්ලුම (ද්‍රවශීලතාවරණය) –</u>

- කිසියම් අවස්ථාවක දී මුදල්,මුදල් වශයෙන් ළඟ තබා ගැනීමට මහජනතාව තුළ ඇති කැමැත්ත මුදල් ඉල්ලුම(ද්‍රවශීලතාවරණය) ලෙස හැඳින්වේ.
- මුදලට ඉල්ලුමක් ඇති වීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතු තුනකි.

1.ගනුදෙනු චේතනාව
2.ආරක්ෂණ චේතනාව
3.සමපේක්ෂණ චේතනාව

<u>1.ගනුදෙනු චේතනාව නිසා ඇති වන මුදල් ඉල්ලුම -</u> පුද්ගලයාට ලැබෙන ආදායම් සහ පුද්ගලයා කරන වියදම් එකිනෙකට නොගැලපීම නිසා එදිනෙදා ගනුදෙනු කිරීමේ අරමුණෙන් මුදල් ශේෂ ළඟ තබා ගැනීමයි.

- ගනුදෙනු චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ පුද්ගලයන්ගේ ආදායමයි.

<u>2. ආරක්ෂණ චේතනාව නිසා ඇති වන මුදල් ඉල්ලුම -</u>සැලසුම් කළ නොහැකි අනපේක්ෂිතව ඇති වන වියදම් කාර්යක්ෂම ව පියවා ගැනීමේ අරමුණෙන් පුද්ගලයන් මුදල් ශේෂ ළඟ තබා ගැනීමයි.

- නිදසුන් - හදිසි අනතුරු,ලෙඩරෝග වැනි අවස්ථාවල දී ප්‍රයෝජනයට ගැනීම සඳහා මුදල් ශේෂ ළඟ තබා ගැනීමයි.

<u>3.සමපේක්ෂණ චේතනාව නිසා ඇති වන මුදල් ඉල්ලුම -</u> පිළිණපත්වල මුදල් ආයෝජනය කිරීමෙන් අනාගත වාසි(ප්‍රතිලාභ) ලබා ගැනීමේ අරමුණෙන් මුදල් ළඟ තබා ගැනීමයි.නැතිනම් වත්කමක් ලෙස මුදල් ශේෂ ළඟ තබා ගැනීමයි.

<u>අභ්‍යාස</u>

1.මුදලට ඇති ඉල්ලුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක 5ක් නම් කර පැහැදිලි කරන්න.